# <u>වාර්ගික හා ආගමික සමගියට බාධා වන අයුරින් හැසිරෙන පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම හා එම පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම සඳහා අදාළ බලධාරීන් වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිදුකරන නිවේදනයයි.</u>

පසුගිය දින කිහිපයේ මුස්ලිම් ප්‍රජාවට එරෙහිව එල්ල වූ ප්‍රචණ්ඩකාරී තත්ත්වය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩි ලෙස හෙළා දකී. මෙම ප්‍රචණ්ඩකාරී තත්ත්වය හේතුවෙන් තෙල්දෙණිය ප්‍රදේශයේ වාසය කළ අබ්දුල් භාසිත් නමැති තරුණයාගේ ජීවිතය අහිමි වූ අතර මහනුවර ප්‍රදේශයේ නිවාස වෙළඳ ස්ථාන හා මුස්ලිම් දේවස්ථාන කේන්ද්‍රකර ගනිමින් විනාශකාරී ප්‍රහාර මාලාවක් ද එල්ල විය.

මෙම ප්‍රචණ්ඩකාරී තත්ත්වයට තුඩුදුන් ආගමික වෛරී ස්වාභාවය සංවිධානාත්මකව සිදු කළ බවට සමාජ ජාල මාධ්‍ය තුළින් ප්‍රචාරය වූ වීඩියෝ දර්ශන සහ ඇතැම් අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ තුළින් පැහැදිලි වේ.

මාධ්‍ය වාර්තා වලට අනුව දැනට උද්ගත වී ඇති ප්‍රචණ්ඩකාරී තත්ත්වයට මූලික වී ඇත්තේ පෙබරවාරි මස 22 වන දින එම්.ජී. කුමාරසිංහ මහතා සහ මුස්ලිම් ජාතිකයන් කිහිපදෙනෙක් අතර හටගත් ආරවුලක් දුරදිග යාමෙන් සිදුවූ පහරදීමක් හේතුවෙන් මාර්තු මස 03 වන දින එම්.ජී. කුමාරසිංහ මහතා ජීවිතක්ෂයට පත්වීමයි. මාධ්‍ය තවදුරටත් වාර්තා කර ඇති පරිදි එම්.ජී. කුමාරසිංහ මහතාට පහරදී ඝාතනය කිරීමට හවුල් වූවායැයි සැකකරනු ලබන පුද්ගලයන් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කිරීම කඩිනමින් සිදුවී ඇත. මේ සම්බන්ධ ඉදිරි නීති පියවර නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම ද අත්‍යාවශයෙන්ම සිදුවිය යුතුය.

මීට අමතරව මුස්ලිම් ප්‍රජාවට එරෙහිව ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදුකිරීමට අනුබල දෙන ආකාරයෙන් වීඩියෝ දර්ශන ජනතාව අතර සංසරණය වීම යන කාරණය පිළිබඳ ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ දැඩි අවධානයක් යොමු වී ඇත. මේ වන විට බෞද්ධ භික්ෂුවක් යැයි කියාගන්නා අයෙක් විසින් සිදුකරන ලද ප්‍රකාශයක් ඇතුළත් වීඩියෝ දර්ශන ඇතුළු මේ ආකාරයේ වීඩියෝ දර්ශන කිහිපයක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතුව පවතී.

අදාළ වීඩියෝ දර්ශනයේ පෙනී සිටින තැනැත්තා සිදුකරන ප්‍රකාශ පිළිබඳව සළකා බැලීමේදී පෙනී යන්නේ සාවද්‍ය තොරතුරු සත්‍ය බව හැගෙන අයුරින් ඉදිරිපත් කරමින් මුස්ලිම් ප්‍රජාවට එරෙහිව ප්‍රචණ්ඩකාරී වාතාවරණයක් ඇතිවන ආකාරයෙන් කටයුතු සිදුකරන අතර මහානායක හිමිවරුන් බෞද්ධ ප්‍රජාවට වඩා මුස්ලිම් ප්‍රජාවට ප්‍රමුඛත්වයක් ලබාදීම පිළිබඳ සඳහන් කරයි.

සියලුම ජන ප්‍රජාවන්ට අයත් පුරවැසියන් හට තවදුරටත් මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවල නිරත වීමෙන් වලකින ලෙසත්, අදාළ ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට වගකිවයුතු පුද්ගලයන් නිසි බලධාරීන් විසින්, පවත්නා නීතිමය රාමුව ප්‍රකාරව අත්අඩංගුවට ගෙන නීතිය හමුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවධාරණයෙන් ඉල්ලා සිටී. මෙවන් තීරණාත්මක මොහොතක ප්‍රචණ්ඩක්‍රියා සිදුකරන පුද්ගලයන් පිළිබඳව නීති ක්‍රියාමාර්ග නොගැනීමේ පිළිවෙතක් අනුගමනය කිරීම හා විපිළිසරභාවයෙන් යුතුව යම් ක්‍රියාමාර්ගවලට එළඹීම තුළින් සිදුවන්නේ තවදුරටත් ප්‍රජාවන් තුල හා ප්‍රජාවන් අතර අවිශ්වාසය, භීතිය සහ ආතතිය වඩා වර්ධනයට ඉඩ සැලසීම මෙන්ම, වෛරය හා ප්‍රචණ්ඩත්වය තීව්‍රවීම සහ වාර්ගික ප්‍රචණ්ඩත්වයට තුඩුදෙන මෙවැනි අපරාධ සම්බන්ධයෙන් දුර්දාන්ත සංස්කෘතියක් රටතුල ස්ථාපිත වීමයි.

අම්පාර සහ මහනුවර ප්‍රදේශ ආශ්‍රිතව මෑත කාලයේ උද්ගත වූ සිදුවීම් හුදෙක් අහම්බෙන් සිදුවූ සිදුවීම් ලෙස සුළුකොට තැකිය නොහැකිවාක් මෙන් ම, ඒවායින් පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකාව වර්තමානයේ දී පසුකරමින් තිබෙන පශ්චාත් යුධ වාතාවරණය තුළ නිරන්තරයෙන් උග්‍රවෙමින් පවතින ප්‍රජාවන් අතර පවත්නා අසමඟිභාවයයි. මෙම සිදුවීම් සඳහා සම්බන්ධ පාර්ශව සහ වෛරී ප්‍රකාශ ඇතුලත් ප්‍රකෝපකාරී වීඩියෝ දර්ශන නිෂ්පාදනයට සම්බන්ධ පාර්ශව අත්අඩංගුවට ගැනීම සහ නීතිය ක්‍රියාවට නැංවීම හා සබැඳි නීතිමය ප්‍රතිපාදන පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිරතුරුවම අදාළ නීති ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන නිසි බලධාරීන් දැනුම්වත්කිරීමට කටයුතු කොට තිබුන ද, මේ දක්වා එසේ අනුගමනය කරන ලද පියවරයන්හී සාධනීය ප්‍රගතියක් දක්නට නොලැබේ. එනමුත්, ප්‍රොත්සාහී ලෙස මේ පිළිබඳ තවදුරටත් කටයුතු කිරීමේ අරමුණින්, විකල්ප

ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අද දින ද නිසි බලධාරීන් වෙත ලිපියක් යොමු කරමින් දන්වා සිටියේ අදාළ පියවරය වඩාත් ස්ථාවර හා කාර්යක්ෂම ආකාරයෙන් මින් ඉදිරියට හෝ අනුගමනය කිරීමට කටයුතු යොදන ලෙසයි. නීතිය හා සාමය පිලිබඳ කටයුතු කිරීමේ වගකීම හිමි නිසි බලධාරීන් තවදුරටත් මේ පිලිබඳ වඩාත් සක්‍රීයව ක්‍රියාමාර්ගවලට එළඹීමට අපොහොසත් වේනම්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නියෝජනය කරන අපගේ අදහස වන්නේ එම නිලධාරීන් ස්වඅභිමතයෙන් සේවාවෙන් ඉවත්වීම හෝ ඔවුන්ව එම සේවාවලින් නීත්‍යානුකූලව ඉවත්කිරීම සිදුවිය යුතු බවයි. පවත්නා තත්ත්වයේ අර්බුදකාරී ස්වාභාවය, සංහිඳියාව උදෙසා වන රජයේ වගකීම ලෙස සැලකෙන ආගමික හා ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය මැඩලීම සහ නීතිය හා සාමය පවත්වා ගැනීම යන කාර්යයන් නිසිලෙස ඉටුකිරීමේ අපොහොසත් බව පිළිබිඹුවන ආකාරයේ වාතාවරණය හමුවේ ඉහත ආකාරයේ සක්‍රීය මැදිහත්වීම් අත්‍යාවශ්‍යය වේ.

මෙරටෙහි ඉතිහාසය තුල ප්‍රචණ්ඩත්වය ඉස්මතු වී ඇති ආකාරය සලකා බැලීමේ දී පෙර සඳහන් කළ ආකාරයේ සිදුවීම් හා ආගම් හා ජන වර්ග අතර වෛරය ඇති කරන ප්‍රකාශ සුළුකොට තැකීම සිදුකල නොහැක්කකි. වෙනත් ආගමිකයන්ට හා වෙනත් ජනවර්ගයන්ට හානිදායකවන ආකාරයේ හිංසන ක්‍රියාවන්ට හේතුවන අනියත බියක් ජනතාව තුල ජනනය කිරීමෙහි සමත් මෙවැනි චර්යා රටා වහාම පිටුදැකීමට නිසි ක්‍රියාමාර්ග ගතයුතු ය. බහු ආගමික හා බහු වාර්ගික රටක් වන ශ්‍රී ලංකාවේ එම අනන්‍යතාව සුරකෙන පරිද්දෙන් කිසිදු චකිතයකින් හෝ අනිසි අනුග්‍රහයකින් තොරව සැමටම රැකවරණ සැලසියයුතු ය. විශේෂයෙන් ජනාධිපතිවරයා සහ අගමැතිවරයා විසින් ඉදිරියේ දී ඇතිවිය හැකි ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් මැඩපැවැත්වීමටත්, නීතියේ ආධිපත්‍යය ප්‍රතිෂ්ඨාපනය කිරීමටත්, පශ්චාත් යුධ වාතාවරණයක් පවත්නා ශ්‍රී ලංකාව තුල අතිශය දුස්සාධ්‍යය මට්ටමක පවතින සාමය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් දුර්වල තත්ත්වයකට ඇදවැටීම නැවැත්වීමත් යන කාර්යයන් උදෙසා අවැසි නායකත්වයේ වගකීම නොපිරිහෙලා ඉටුකළයුතු ය.